# 10 කුරුළු පාළුව

සිංහල භාෂාව කතා කරන ජනයා අතර ප්‍රාදේශීය වශයෙන් ඔවුන්ගේ ව්‍යවහාරයන්හි යම් යම් වෙනස්කම් දක්නට ලැබේ. එක් එක් ප්‍රදේශවල භාෂා උච්චාරණයේ හා අර්ථ දැක්වීමේ වෙනස්කම් දැකිය හැකි ය. හත්කෝරළයේ ඇත්තන්ගේ කතාබහ ඇසුරින් සැකසී ඇති මෙම පාඩම මහින්ද කුමාර දළුපොත මහතාගේ '**වටපිළ**' ග්‍රන්ථය ඇසුරින් සකස්කරන ලද්දකි. ප්‍රාදේශීය ව්‍යවහාර පිළිබඳ දැනුමක් ලබා ගැනීමට මෙම පාඩම ප්‍රයෝජනවත් වේ.

යල මහ දෙකන්න මහගමරාල උන්දැගේ නැත්තං, විදානේ උන්දැගේ ඇල්ම බැල්ම යටතේ කුඹුරු ගොයිතැං බත් කළ පුරාණ හත්කෝරළයේ වැව්ගම්මානඹල ඇත්තන් කවුරුත් එකා වගේ කුරුළු පාළුව වපුරන්න හවුල් වෙනවා. ඒක පුරාණේ පටන් පැවත එන කුඹුරු කෙරුවාවේ සම්මතයක්, මේ සම්මතය මොනයම් ම ජගතෙකුටවත් බිඳින්න නං මහගමරාල උන්දැ ඉඩක් තියන්නේ නැහැ. විදනේ උන්දැත් එහෙම තමා.

යල මහ කුඹුරු වපුරන්නේ වැවේ දියවරින්. නැතිනං අහස් වතුරින්. ඒ කොයි හැටි වෙතත්, යාය කලට වේලාවට වපුරන විට කුරුළු පාළුවත් ඒ එක්කලා ම වපුරනවා. උහුලාගන්ට බැරි තරම් ඉඩෝර සමයක දී නම් වැවේ රැස්වෙලා තියෙන සීමිත දියවර බෙදාගෙන වැව්ගම්මානඹල ඇත්තං බෙත්මට ගොයිතැන් කරනවා. කොයිතරම් දියවර හිඟ වුණත් කුරුළු පාළුවට වෙන්කෙරෙන ඉඩකඩ වෙන්වෙනවාමයි. වැව නිට්ටාවට ම හිඳිලා ගිය කන්නක දී වැවේ මඩතාවලු ගොවිතැනට බැස්සත් එයිනුත් ඩිංගක් හරි කුරුළු පාළුවට කියලා ඉඩාරිනවා. මොකක් ද මේ කුරුළු පාළුව කියලා කියන්නේ. ඒ තමා යායේ කුරුළු කොබෙයියන් උදෙසා ම වෙන්කරන කුඹුරු කොටහා. කුරුළු පාළුව කොයිතරං සාරෙට පැහුණත් ඒකේ බුත්තිය උරුමයෙන් හිමිවන්නේ ගංකරයේ වන රොදඹල ජීවත්වෙන කුරුළු කොබෙයියන්ට යි.

ඇයි, මෙයාකාරයෙන් පුරාණ හත්කෝරළයේ වැව් ගම්මානඹල ඇත්තන් කුරුල්ලන්ට කොටහක් කුඹුරු යායෙන් වෙන්කරන්නේ. ඒ මොකවත් නිසා නෙමෙයි, කුරුල්ලන් උදෙසා නිත්තෙන් කොටහක් නැතිනං ගංකරයේ වන රොදවල්ඹල ඉන්නා කුරුල්ලන්ගෙන් මුළු කුඹුරු යායට ම අරියාදු වෙනවා. ඇයි යායේ ලියදි පැහුං වැටෙන කොට වටේට ම ඉන්න කුරුළු කොබෙයි වහවැටෙනවා නොවැ. රංචු පිටින්. මෙන්න මේ උවදුරු මගහරවාගන්ට පාසු කරමේ තමයි කුරුල්ලන්ට ම කියලා නිත්තෙන් කොටහක් බෙදලා දීම. කළහුරෙන් පෙරහුරෙන් දැන හුරුකම්ඹලින් තමයි මහගමරාල උන්දැ කාටත් තේරුම් බේරුම් කරලා දෙන්නේ ගොයිතැං බත් කරන්නේ කොයි පිළිවෙළට ද කියලා.

ඕනෑ ම වැව්ගම්මානයක කුඹුරු යාය පිහිටලා තියෙන පිළිවෙළක් තියෙනවා. ඒ රටාව කුඹුරු යායෙන් කුඹුරු යායට වෙනස් වෙනවා. පෙළක් කුඹුරු යායක් අද්දරක ගම්මැද්දේ ගංගෙවල්, ඊට පාවුලින් හරක් ගාල් එහෙම තනාගෙන තියෙන අතර යාය ඉහත්තාවෙ වැවත් ඊට ඔබ්බෙන් වැව් තාවුල්ලත් තියෙනවා. එහෙව් කුඹුරු යායක ඊට හාත්පස ඉසව්වෙන් මූකලං කැලෑවක් නැතිනං පිල්ලෑවක් වගේ වන රොදක් තියෙනවා. මෙන්න මේ ආකාරයට වන රොද පැතිරිලා තියෙන ඉසව්වෙන් තමයි කුරුලු පාළුව සඳහා කනටි කැලි වෙන් කරන්නේ. ඒ වගේමයි, මහගමරාල උන්දෑ දන්නවා පාන්දර පිනි පිට ම කුරුලු කොබෙයියන් වන රොදින් එළිබහින්නේ කොයි ඉසව්වෙන් ද කියලා. ආං ඒ ඉසව්ව අල්ලලා හීනියට දිග කනටි තීරුවක් වෙන්කරනවා කුරුලු පාළුව සඳහා. කුඹුරු යායේ දිග පළල හා පිහිටි පොළොවේ හැටි සොබාවය අනුව කුරුලු කොබෙයියන් ලගින වන බැද්ද පිහිටි පෙළක් විටක මේ කනටි කැලිවලට පිටාවතිං කුරුලු කොබෙයියන් උන්ට ම කියලා එළිබහින බිංකඩක් තනාගෙන තියෙයි නං ඒ ඉසව්වෙං කුරුලු පාළුවට හීං බිම් තීරුවක් වෙන් කිරීමේ බලය පැවරිලා තියෙන්නේ මහගමරාල උන්දෑටයි.

කුරුලු පාළු උදෙසා වෙන් කරන ලියදි කැල්ල ගංකරයේ කාටත් උරුම යි. ඒක වගා කිරීමට බිං හැම පෝරු ගෑම පමණක් නො වෙයි වැපිරීම පවා සිදුවෙන්නේ සාමූහිකවයි. බොහෝ විට කුරුලු පාළු අද්දර ලියදි වගා කරන ගොයියන් තම තමුන්ගේ බිං කැබැලි වපුරන විට නිත්තෙන් ම කුරුලු පාළුවත් වපුරනවා. හැබැයි කුරුලු පාළුවට පැළ වී දෙන්ට නියම වෙලා තියෙන්නේ මහගමරාල උන්දෑටයි. මෙයාකාරයෙන් කුරුලු පාළුව වැපුරුවාට මදි. පැළ ගොයමට නිසි සාත්තු සප්පායං කිරීමත් මහගමරාල උන්දෑ අතින් සිදුවෙනවා.



යාය මහ බණ්ඩි අල්ලන සමයෙන් පහු පණු රෝග පැතිරෙන්ඩ තියෙන ඉඩහසර ඉහළ යනවා. පීදුං වැටෙන සමයට හා කිරිවැදෙන සන්දියේ පණුරෝග තියෙනවා දැයි සැක හැරලා දැනගන්නේ කුරුලු කොබෙයියන්ගේ කචබචයෙන්. යාය අද්දර වන රොදින් පාන්දර පිනිපිට ම එළිබහින කුරුලු කොබෙයියන් කෑම හොයාගෙන යායේ ලියදිඔලට පාත්වෙනවා නම්, නිත්තෙන් ම ඒ දූත ලකුණෙන් දැනගන්නවා, හෙනං යායට පණුරෝග වැලඳී තිබෙනවා කියලා. කුරුලු පාළුව බුත්ති සත්ති විඳින කුරුලු කොබෙයියන් කොයිතරං හෝදිසි කරලා බලාකියා ගත්තත්, ගොයං පඳුරු අතරේ පණුරෝග ඇතිවෙන්ට පුළුවන්. ඒ අවස්ථාවේ දී ඒ ගැන හොඳ හෝදිසියක් තියෙන්නේ කුඹුරු යාය අද්දර වන බැද්දේ ලගින කුරුලු කොබෙයියන්ටයි. පාන්දර කුරුලු කොබෙයියන් ගොයං යායේ කචබචය පටන් ගන්නා විට නොපමා ව මහගමරාල උන්දෑ නැතිනම් විදානේ උන්දෑ, දූන් හෙනම් කල්පහු නොකොට යායේ "**කිරි උතුරවමු**" කියලා පාන්දරින් ම කිරි උතුරවනවා. එයින් කරන්නෙත් යායේ වටේ ඉන්නා කුරුල්ලන්ට ආරාධනා කිරීමක්.

කුඹුරු යාය පුවක් අත්තේ පැහුං පාට වැටෙනකොට ගොයං කැපීමට කොබෙයියන් රෑන් පිටින් වලිකනවා වී කරල් කඩාගෙන යන්ඩ. නීල කොබෙයියන් එක රොත්තට පිරිවරාගෙන එනවා. ආං ඒ කුරුලු කොබෙයියන්ට තමා නිදහසේ බුත්ති විඳීමට කුරුලු පාළුව තියෙන්නේ. වන බැද්දෙන් එළියට බහින තැන තියෙන ලියදිඔලින් කරල් කඩා ගන්වා හිටුගැවිල්ලේ. ඒ ආකාරයෙන් කරල් කඩා ගන්නා විට යාය මාදලස්සටත් ගාටන්නඩ බැරි නෑ. එහෙව් එකක් වේගෙන එනවා නම් කුරුලු පාළුව අද්දරිං ඉපල් අතු තීරයක් නියරවල් පිට හිටෝනවා. එවිට ඉපල් අතු මැද්දෑවෙන් එපිට කෙත්යායට නොගිහිං කුරුලු කොබෙයියන් උදෙසා ම වෙන් කරලා තියෙන කුරුලු පාළුව රිසි සේ බුක්ති සත්ති විඳීමට කුරුල්ලන්ට හැකි වෙනවා.

**අරුත් පැහැදිලි කිරීම**

| | | |
|---|---|---|
| ඉපල් | - | කොළ වියළී හැලී ගිය අතු |
| ඉහත්තාව | - | ඉස්මත්ත |
| කනටි | - | කුඹුරේ කෙළවර පිහිටි අසාරවත් කුඩා ලියද්ද |
| කළහුරෙන් | - | ක්‍රියාවේ හුරුකමෙන් |
| කුරුලු පාළුව | - | කුරුල්ලන්ගේ ආහාරය සඳහා වෙන්කළ කොටස |
| පැහුං වැටෙනවා | - | පැහෙනවා |
| පිල්ලෑව | - | එළිමහන් ස්ථානය |
| බෙත්ම | - | බෙදීම/වැවෙහි දිය තිබෙන පමණ අනුව කුඹුරුවලට දිය බෙදා දීම |
| මඩතාවලු | - | වැවේ මඩතාවුල්ල වගා කිරීම |
| හිටුගැවිල්ල | - | එකදිගට |

## ක්‍රියාකාරකම 01

**පාඩම හොඳින් කියවා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) කුරුලු පාළුව නිසා යායට සිදුවන යහපත කෙටියෙන් ලියන්න.
(ii) කුරුලු පාළුව වගා කරන ආකාරය දක්වන්න.
(iii) කුරුලු පාළුවට බිම් තීරුව වෙන්කිරීමේ බලය පැවරී ඇත්තේ කවරෙකුට ද?
(iv) කුඹුරු යායේ රන් අස්වනු නෙළන කාලයේ දී කුරුල්ලන්ගේ හැසිරීම් රටාව පැහැදිලි කරන්න.
(v) වැව්ගම්මානවල ඇත්තන්ගේ සාමූහික බව හෙළිදරව්වන අවස්ථාවක් දක්වන්න.
(vi) කුරුලු පාළුව රිසි සේ භුක්තිවිඳීමට අවස්ථාව සලසා දීමට ගත් උපක්‍රමය කුමක් ද?

## ක්‍රියාකාරකම 02

ප්‍රාදේශීය ව්‍යවහාරවලින් හෙළිවන පොදු ව්‍යවහාර කීපයක් පහත සඳහන් වගුවෙහි දැක්වේ.

| ප්‍රාදේශීය ව්‍යවහාර | පොදු ව්‍යවහාර |
|---|---|
| i. ඉන්තේරුවෙන් | සම්පූර්ණයෙන් |
| ii. අල්ලපනල්ලෙ | ඔය අතරතුර |
| iii. අල්ලිකේනවා | උදලු ගානවා |
| iv. නාම සද්දයක් නෑ | කිසිම ආරංචියක් නෑ |
| v. වසත්තු කිරීම | කිසිවක් හෙළි නො කිරීම |
| vi. සෝමාරියා | අලසයා |

ඉහත සඳහන් ආකාරයට ප්‍රාදේශීය ව්‍යවහාර දහයක් හා ඒවායේ පොදු ව්‍යවහාර වගුගත කරන්න.

| ප්‍රාදේශීය ව්‍යවහාර | පොදු ව්‍යවහාර |
|---|---|
| | |

## ක්‍රියාකාරකම 03

(i) 'කුරුලු පාළුව' යනුවෙන් ළමා පුවත්පතකට ලිපියක් සකස් කරන්න.

(ii) පන්තිය කණ්ඩායම්වලට බෙදී ප්‍රාදේශීය භාෂා ව්‍යවහාර සඳහන් ග්‍රන්ථ පරිශීලනය කොට, කරුණු සොයා, පහත දී ඇති එක් එක් ප්‍රදේශයේ භාවිත වන භාෂා ව්‍යවහාර 5 බැගින් වගුගත කරන්න.

- (i) දිගාමඩුලු ජනවහර
- (ii) වැව් බැඳි රාජ්‍ය ජනවහර
- (iii) ඌව ජනවහර
- (iv) රුහුණු ජනවහර
- (v) පානම ජනවහර

## ක්‍රියාකාරකම 04

මුලින් දී ඇති යෙදුම්වලට ගැළපෙන වචනය ත්‍රිකෝණය තුළින් තෝරා ලියන්න.

- (i) වෛතාලය
- (ii) අලිබොටා
- (iii) කුඩප්ප
- (iv) ගොම්මන්වෙලාව
- (v) හේමලයා
- (vi) අල්ලපනල්ලෙ
- (vii) අකම්පාලවීම
- (viii) ගොන්කවඩියා
- (ix) දඬුබස්නාමානය
- (x) පොහොනි කිරීම

කනගාටුවීම
උදෑසන
අතරතුර
අලියා, හිරු බසින
වෙලාව
මයිනා, හෙවණැල්ල
බාප්පා, සංග්‍රහ කිරීම
ඊය වැටෙන දුර
හදිසියෙන්
ප්‍රථමයෙන්

## ක්‍රියාකාරකම 05

(i) සාත්තුසප්පායං, කචබචය, පාඩමෙහි සඳහන් යුගල පද කීපයක් වේ. පාඩමේ ඇති එබඳු පද පහක් උපුටාගෙන අර්ථය පැහැදිලි වන සේ වාක්‍ය නිර්මාණය කරන්න.

(ii) මේ පාඩමේ යෙදී ඇති වැව්ගම්මානඔල, ලියැදිඔල යන වචන කෙරෙහි අවධානය යොමු කරන්න. මෙහි අවසානයේ ඇති 'ඔල' යන්න පොදු ව්‍යවහාරයේ 'වල්' ප්‍රත්‍යයට සමාන වේ. පාඩමේ ඇති මෙබඳු තවත් පද එකතු කරන්න.

(iii) ගොවියා හා පරිසරය අතර පවත්නා සමීප සම්බන්ධතාව මෙම පාඩමෙන් හෙළි වේ. මෙබඳු අවස්ථා ගැන තොරතුරු සොයා කෙටි ලිපියක් සකස් කරන්න.

(iv) තමන් වෙනුවෙන් කනටියක් වෙන්කර වැවීම ගැන තම යායේ කුරුල්ලන් මෙසේ සතුටට පත්වෙනු ඇතැ'යි සිතේ.

**'යායේ කනටියක් වෙන්කොට වැව්වාට තුති පුදනෙමු ගංකරයේ ගොවියාට'**
මෙවැනි තුති පිදුමක් සඳහා පද්‍ය දෙකක් නිර්මාණය කරන්න.